# සංගීත්

*SANGEET*

පෙරදිග සංගීත ශාස්ත්‍රීය අධ්‍යාපන සඟරාව


පළමු කලාපය

ප්‍රථම මුද්‍රණය - 2016, අගෝස්තු

සංස්කරණය : නිශාද් හඳුන්පතිරණ

ප්‍රකාශනය : සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටකවරය සිතුවම සහ කවර නිර්මාණය : සේනානන්ද ඉන්ද්‍රජිත් මර්තිස්,
චිත්‍ර කලා ඒකකය, සෞන්දර්ය අධ්‍යාපන
ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය,

පිටු සැකසුම : ඇපල් පරිගණක අංශය - රජයේ මුද්‍රණාලය
මුද්‍රණය : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව



දු. අංක : 0112784259
ෆැක්ස් : 0112784863
ඊ.මේල් : info@moe.gov.lk


මෙම සඟරාවෙහි අන්තර්ගත ලිපිවල සඳහන් කරුණු සහ අදහස්, ලිපි රචකයින් සතුය.

## ''ගසල්'' යනු ගායන විශේෂයක්ද නැතහොත් කාව්‍ය විශේෂයක්ද?

ගසල් ගායනය යනු උතුරු ඉන්දියාව සහ පකිස්තානය තුල ඉතා ජනප්‍රිය සංගීත අංගයකි. ගසල් ආරම්භයේදී කාව්‍ය ශෛලියකි. එය කියවීම තුලින් සහ තවත් අයෙකුගේ හඬින් ඇසීම තුලින් එහි ඇති කාව්‍යමය රසය විඳීමට හැකියාව ඇත. පසුකාලීනව ගසල් ගායනය කිරීමෙන් ඉදිරිපත් කිරීම බහුලව සිදුවන්නට විය. ගසල් ගායනයේ ආරම්භයේ සිට අද දක්වා එහි විකාශනය පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් මෙම ලිපිය තුලින් ඉදිරිපත් කෙරේ.

ගසල් තුල  හමුවන යම් යම් කාව්‍ය අංග අරාබියානු (Farmer, 1928; Al-Amuli, 1335-1342) පැරණි සාහිත්‍ය මූලාශ්‍රවල හමුවන නමුත් ගසල් උත්පත්තිය පිළිබඳව තොරතුරු පර්සියානු සංස්කෘතික මූලාශ්‍ර තුල වඩාත් පැහැදිලි ලෙස දක්නට ඇත. (Browne, 2002; Al-Muqbil, 2007) ගසල් සංකල්පය පර්සියානු සංස්කෘතිය ආශ්‍රයෙන් සහ ඒ තුලින් බිහිවී වර්ධනය වී ඇති බව තහවුරු වීමට බොහෝ මූලාශ්‍ර තුල සාක්ෂි හමුවේ. ජුගන් එල්ස්නර් (2013) පවසන අන්දමට මුහම්මද් තුමා පිළිබඳ ලියවී ඇති වාර්තා තුල ''ගසල්'' යන්න සඳහන් වේ. ඉබන් ගයිබි (N.Y.) සඳහන් කරන අන්දමට ගසල් කාව්‍ය භාවිතය 14 වන ශතවර්ෂය තුල ලියවී ඇති නෞබා තුළින් ද හමුවේ. 15 වන ශතවර්ෂයට අයත් තුර්කියේ හමුවන ඇතැම් මූලාශ්‍රවලද ''ගසල්'' යන්න සඳහන් වේ. (Elsner, 2013; Hasan, 1986) 12 වන හෝ 13 වන ශතවර්ෂයන්හි සිට ''ගසෙලේ'' හෝ ''ගසල්'' නමින් හැඳින්වෙන ප්‍රධාන කාව්‍ය අංගය පර්සියාවේ විසූ සාදි, රූමී සහ හෆීස් යන කවීන් මගින් පෝෂණය වන්නට විය. (Farmer, 1928) මෙම කවියන් විසින් රචිත ගසල්, පසුව රාජසභාවන් තුල පවත්වන ලද නවුබත් නැමැති මුස්ලිම් ආගමික ශාන්තිකර්මවලදී භාවිතා වී ඇත (Sayyied Naqi, 2010; Al-Farabi, N.Y.). මෙම ක්‍රියාකාරකම් සිදුකර ඇත්තේ පුරුෂ පක්ෂයේ ශිල්පීන් විසින් පමණක් වීම විශේෂ කරුණකි. ආදරය ප්‍රේමය හා සම්බන්ධ තේමා වලින් යුත් කෙටි පදවැල් ඇතුලත් කිසියම් මිම්මකට අනුව රචනා වී ඇති ගසල්, ඉතා සරළ හා සංකීර්ණ අදහස් ප්‍රකාශ කළ හැකි අනර්ඝ කාව්‍ය කෘතියකි (Meisami, 1998). මේ අනුව සාහිත්‍යය පිළිබඳ බොහෝ විද්වතුන්ගේ මතය වන්නේ ගසල් මගින් සාර්ථක ලෙස අදහස් ප්‍රකාශ කිරීමේ සහ සාහිත්‍ය රසය ලබාදීමේ අවස්ථාව ඇති බැවින් එය ඉතා සාර්ථක සාහිත්‍ය අංගයක් බවයි. ගසල් පර්සියාවේ සහ පර්සියානු බලපෑමට ලත් ප්‍රදේශ තුල සංවර්ධනය වී විශාල වශයෙන් පෙරදිග ඉස්ලාම් ලෝකය තුල ජනප්‍රිය වන්නට ආරම්භ වූයේ දෙවන ශතාබ්දියේ අවසාන භාගයේ සිටය (Browne, 2002). ආරම්භයේදී ගසල් පර්සියානු භාෂාවෙන් රචනා වුවද, පසුව පර්සියානු ආභාශය විශාල වශයෙන් ලැබූ තුර්කි සහ උර්දු යන භාෂාවන්ගෙන් ද රචනා වන්නට විය (Elsner, 2013). පර්සියාවේ මධ්‍යතන යුගයේ මුල්භාගයේ ඉතා කීර්තිමත් රාජකීය කාව්‍ය විශේෂය ලෙස සලකනු ලැබුවේ ඛසීඩා යන කාව්‍ය විශේෂයයි. මෙය අරාබි සාහිත්‍යයේ විශේෂ සංස්කෘතික සාහිත්‍ය අංගයක් වන අතර පර්සියාවේ ද ප්‍රචලිත විය. කෙසේ වෙතත් ඓතිහාසික තොරතුරු අනුව පෙනී යන්නේ, ගසල් ඉතා සීඝ්‍රයෙන් පර්සියානු රාජසභාව තුල පමණක් නොව සූෆි ආගමික මූලස්ථාන වල පවා අධික ලෙස භාවිතා වී ඇති බවයි. කොන්යාවේ විසූ සූෆි ආචාර්යවරයෙකු වන

ජලාල් අලි-දින් රූමි (d. 1273) විසින් මුල් අවධියේ රචිත ගසල් එකතුව, සාහිත්‍යමය සහ ආගමික වශයෙන් ඉතා උසස් සනයේ රචනාවක් ලෙස සැලකේ (Bausani, 1960 & 1965). ඔහුගෙන් පසුව රාජකීය කවියන් විසින් බොහෝ ගසල් රචනා කර ඇත. මේ අතර ශිරාස් නැමති ප්‍රදේශයේ විසූ හෆීස් (d.1399) නැමති කවියා ආදරය තේමාව කරගෙන මිනිසා තුල දෙවියන් කෙරෙහි ඇති භක්තියත්, ආදරයත් සහ මානව දයාවත්, ප්‍රේමයත් ජනිත වන ආකාරයට ව්‍යාංගාර්ථාත්මක ස්වභාවයෙන් පෝෂිත වූ ගසල් නිර්මාණය කර ඇත (Avery, 2007).

ඉන්දියාව තුල ගසල් ප්‍රචලිත වන්නට වූයේ දිල්ලි රාජධානිය තුල විසූ අමීර් ඛුස්රූ (d.1325) නැමති කලාකරුවා විසින් එය හඳුන්වා දීමෙන් පසුව බව සැලකේ. (Manuel, 1989; Qureshi, 1990) ඔහු විසින් රචිත පර්සියානු ගසල් තුල ඍජුව අදහස් ප්‍රකාශ කිරීමේ ස්වභාවයක් තිබූ බව පැවසේ. ඔහුගේ ශාස්ත්‍රීය හැකියාව මත පදනම් කරගෙන ''ඉන්දියාවේ ගිරවා'' (තොතී-එ-හින්ද්) යනුවෙන් අනුවර්ත නාමයක්ද පටබැඳී ඇති බව සඳහන් වේ. මූගල් රජවරුන්ගේ අසීමිත රාජ අනුග්‍රහය ලැබීම හේතුවෙන් ගසල් ඉන්දියාව තුල වඩ වඩාත් සංවර්ධනය වන්නට විය. ගසල් රචනා කරන ලද ප්‍රතිභාපූර්ණ කවියන් ලෙස තබ්‍රිස් ප්‍රදේශයේ විසූ සයිබ් (d.1677) සහ පට්නා ප්‍රදේශයේ විසූ බෙදිල් (d.1721) යන කවීන් විසූ කාලය ඉන්දියාවේ ගසල් කාව්‍යයේ දියුණුවේ උසස්ම අවධිය ලෙස සැලකේ (Hasan, 1986). පර්සියානු ගසල් අභිබවා යමින් උර්දු භාෂාවෙන් (පර්සියානු සහ ඉන්දීය භාෂා සංකලනය) රචිත ගසල් ඉන්දියාව තුල සීඝ්‍රයෙන් ජනප්‍රිය වන්නට වූයේ දාහත් වන සියවසේ ඉන්දියාවේ විසූ මුස්ලිම් රජවරුන්ගේ අනුග්‍රහය නිසාවෙනි. දාහත් වන සියවසෙන් පසුව ඉදිරිකාලය තුල ගසල් රචනාවන් නව මුහුණුවරක් ගෙන ඇත්තේ ආදරය පදනම් කරගත් දේශීය /ග්‍රාමීය කාව්‍ය රචනා වල අදහස සහ අංග ඇතුලත් කොට උර්දු ගසල් රචනා කිරීම හේතුවෙනි. දහඅටවෙනි සියවසේ දිල්ලි සහ ලක්නව් රාජධානීන් තුල බිහිවූ කවීන් වන මීර් තාකි (d.1810) සහ ගාලිබ් (d.1869) ඉතා ප්‍රචලිත ගසල් රචනා කල කවීන් අතර වෙති (Manuel, 1989; Qureshi, 1990). ගසල් කාව්‍ය රචනයේ ඇති විශේෂ ලක්ෂණ හඳුනා ගැනීම තුලින් එය වෙනත් කාව්‍ය ශෛලීන් අතර විශේෂ වන්නේ කෙසේද යන්න තහවුරු කර ගත හැක. ගසල් කාව්‍ය ලක්ෂණ හැඳින්වීමට යොදා ගැනෙන පාරිභාෂික උර්දු වචන මගින් ගසල් කාව්‍ය නියමයන් හඳුනා ගත හැක.

<u>ශේර්</u> - ශේර් යන්න බෙත් යනුවෙන්ද හැඳින්වේ. ශේර් යනු එලිවැට සහිත පදවැල් දෙකකින් සමන්විත කවියකි. ශේර් එකක් තුල සම්පූර්ණ වූ අදහසක් ඇත. ශේර් යන්නෙහි බහු වචනය ආශාර් යන්නයි.

<u>බෙත්-උල්-ගසල්</u> - බෙත්-උල්-ගසල් යන්න වෙනත් ආකාරයකින් හැඳින්විය හැක්කේ හුස්න-එ-ගසල් යනුවෙනි. ගසල් පංතියක හමුවන වඩාත් කැපීපෙනෙන ශේරය මේ නමින් හැඳින්වේ.

<u>මිස්රා</u> - ශේර් එකක පදවැල් දෙකක් ඇතුලත් වන අතර මෙම පදවැල් මිස්රා නමින් හැඳින්වේ. මේ අනුව ශේර් එකක මිස්රා දෙකක් ඇත.

මිස්රා-ඒ-උෆලා - ශේර් එකක පලමුවන පදවැල

මිස්රා-ඒ-සානි - ශේර් එකක දෙවන පදවැල

බෙහෙර් - ශේර් එකක ඇති පදවැල් දෙකම මාත්‍රා ගනනින් සමාන විය යුතුය. බෙහෙර් යනු මාපකය හෝ මිම්ම (Meter) යන්නයි.

අර්කාන් - පදවැලක ඇති දීර්ඝ සහ කෙටි අක්ෂර පිළිවෙල සහ ගණන ආකෘතිගත කර ඇති අනුව්‍යාජ අක්ෂර සමූහය. උදාඃ මෆා ඉලුන් ෆිඉලාන් මෆාඉලුන් ෆිලුන්

රඩිෆ්-ශේර් - ශේර් වල දෙවන පදවැල නිමාවිය යුතු වචනය හෝ වචන කීපය. මෙම වචනය /වචන සෑම ශේර් එකකම සමාන විය යුතුය.

ඛාෆියා - පලමු ශේරයේ රැඩිෆ් වන වචනයට ප්‍රථම හමුවන වචනයත් ඒ ආකාරයෙන්ම අනෙක් ශේර් වල දෙවන පදයත් සමග රටාවෙන් සමාන විය යුතුය. මෙය ඛාෆියා නමින් හැඳින්වේ.

මත්ලා - ගසල් පංතියකට ප්‍රවේශ වන ශේරය හෝ තේමාව වන ශේරය මත්ලා නමින් හැඳින්වේ. කෙසේ වෙතත් මේ හා සමාන තවත් ශේරයක් එම ගසල් පංතියේම තිබිය හැක. මෙය මත්ලා-එ-සානි / හුස්න-එ-මත්ලා යන නම් වලින් හඳුන්වයි.

මඛ්තා - ගසල් පංතිය රචනා කරන ලද කවියාගේ අනුවර්ත නාමය යන්න තඛල්ලුස් නමින් හැඳින්වේ. ගසල් පංතියක අවසාන ශේරය (මඛ්තා) නමින් හැඳින්වේ. එහි තඛල්ලුස් ඇතුලත් විය යුතුය.

ඉසzාෆත් - පර්සියානු භාෂාවේ නිතර යෙදෙන අක්ෂර ගසල් රචනා වල බහුල ලෙස යෙදේ (ම සහ එ යන අක්ෂර වැනි).

පර්සියාවේ සහ ඉන්දියාවේ සංස්කෘතිය තුලින් අද දක්වා විකාශනය වී ඇති උර්දු ගසල් තුල රූපක සහ අලංකාර ඉතා බහුලව යෙදේ. මෙම ගසල් වලින් ජනිත වන ඇතැම් අදහස් සහ තේරුම් ගැඹුරින් අවබෝධ කරගැනීමට එම සංස්කෘතිය පිළිබඳ දැනුම සහ අත්දැකීම් අත්‍යාවශ්‍ය වේ. ගසල් පංතියක ඇති සෑම ශේර් එකක්ම සම්පූර්ණ අදහසක් දරන අතර එම ශේර් වල එකතුව යම් හෙයකින් අපූර්ව ආකාරයකට සම්බන්ධ වේ. මෙය සර් විලියම් ජෝන්ස් විසින් විස්තර කරන්නේ ''Orient pearls at random strung'' යනුවෙනි (Arberry, 1946).

ඉන්දීය මෝගල් සංස්කෘතිය තුල බිහිවූ උර්දු ගසල් රදල පන්තිය තුල භාවිතා වූ කාව්‍ය සහ ප්‍රසංගාත්මක කලාවක් විය. රදල පංතියේ අධ්‍යාපන පාඨමාලාවන් තුළ ද ගසල් පිළිබඳ අවබෝධය සහ නිර්මාණ හැකියාව ප්‍රගුණ කිරීම ඇතුලත් වී ඇත. උසස් සමාජ පංතිය තුල ගසල් පදවැල්

සාමාන්‍ය ව්‍යවහාරයේදී පවා භාවිතා කිරීම සාමාන්‍ය සිරිත විය (Qureshi, 1990). ගසල් යන්න ගායන විශේෂයක් විය හැක්කේ කෙසේද යන්න විමසා බැලීමට ගසල් කාව්‍ය ඉදිරිපත් කල අවස්ථාවන් පිළිබඳව සොයා බැලීම වැදගත් වේ.

යම් ආකාරයක තරඟකාරී ස්වරූපයක් දරන ගසල් රචකයින්ගේ පරිසංවාදය ''මුෂයිරා'' නමින් හැඳින්වේ (Qureshi, 1990). මෙහිදී නව ගසල් රචනාවන්, ගසල් පිළිබඳ සාහිත්‍ය ධරයන් විසින් එක්රැස් වී ඉදිරිපත් කරයි. මෙය ගායන සවරූපයෙන් හෝ කියවීමේ සවරූපයෙන් රැස්ව සිටින අනෙකුත් උගතුන් හමුවේ එලි දක්වයි. ගසල් කියවීම හෝ පැවසීම දෙආකාරයකින් සිදු කෙරේ. එනම් ආසාතානුකූලව හෝ තාලානුකූලව යම් රිද්මයකට අනුව පැවසීම, සහ අනිත් ආකාරය වන්නේ සජ්ජායනය කිරීමේ ශෛලියෙන් පැවසීමයි. මුල් අවධියට අයත් මුෂයිරා තුල හමුවන විශේෂ ලක්ෂණයක් වන්නේ එහිදී පුරුෂ පක්ෂයේ කිවියන්ගේ පමණක් සහභාගීත්වයයි.

රිද්මයකට හෝ තාලානුකූලව පැවසීම තහ්ත්-උල්-ලෆ්ස් යනුවෙන් හැඳින්වෙන අතර සජ්ජායන ස්වරූපයෙන් පැවසීම තරන්නුම් යනුවෙන් හැඳින්වේ. වෘත්තීය සංගීත ශිල්පීන් විසින් ගායනා කිරීම මගින් ගසල් ඉදිරිපත් කිරීම ප්‍රධාන වශයෙන් දෙආකාරයකින් සිදුවී ඇත. එනම් සූෆි ආගමික ස්ථාන වල, දෙවියන් සඳහා ඇති ආදරය, සහ භක්තිය ප්‍රකාශ කෙරෙන ගසල් රචනා ඛව්වාලි ගායන විලාසයෙන් ඉදිරිපත් කිරීම සහ අභිසරුලියන්/වෘත්තීය වෛශ්‍යාවන් (තවාඉෆ්) විසින් තම පෞද්ගලික ස්ථාන වල නර්තනයේ යෙදෙමින් ගසල් ගායනා කිරීමයි.

වෛශ්‍යාවන්ගේ අමුත්තන් රැස්වන ශාලාවක් (මෙහෆිල්, මුජ්රා) ඉදිරිපත් කරනු ලබන ගසල් රචනා වී ඇත්තේ ආලය හා සම්බන්ධ තේමාවන් මූලික කරගෙනය. වෛශ්‍යාවන් මෙම ගායනා මගින් රැස්ව සිටින තම පාරිභෝගිකයන්ගේ සිත දිනා ගැනීමත් ඒ මගින් මුදල් දීමනා/තෑගි ලබා ගැනීමත් සිදුවේ. මෙහිදී රැස්ව සිටින විට බලයෙන් සහ ධනයෙන් උසස් පාරිභෝගිකයන් අතර මෙම තරගකාරී බව ඇති වේ. මීට අමතරව ගසල් ගායනයන් රාජ සභාවන් තුළ ද ඉදිරිපත් කර ඇති අතර, මෙම ගසල් සාහිත්‍යමය වශයෙන් වඩා උසස් සහ ගුප්ත සහ ව්‍යාංගාර්ථයෙන් ආලය සහ දෙවියන් සඳහා ඇති ආදරය/භක්තිය ප්‍රකාශ කිරීම තේමාවන් වී ඇත.

1857 වර්ෂයේ බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ඉන්දියාව තුල ඇතිවූ ඉන්දියානු හමුදා කැරැල්ලෙන් පසු බ්‍රිතාන්‍ය පාලනය විසන් ඉන්දියානු රදල පංතියෙහි බලතල ක්‍රමයෙන් හීන කිරීමට ක්‍රියාමාර්ග සලසන ලදී. මෙම සමාජ පංති පෙරලීම සහ සමාජ විෂමතාවයන් යම් දුරකට බිඳ වැටීම හේතුවෙන් නැගී එන මධ්‍යම පංතියේ ජනයා අතරද ගසල් ව්‍යාප්ත වන්නට විය. මෙම සමාජ ස්ථර පෙරලීම් සමඟ ගසල් රචනා ශෛලිය, එහි භාවිතය සහ මුහුනුවරද ක්‍රමක්‍රමයෙන් වෙනස් වන්නට පටන් ගත්තේ ඉන්දියාව තුල පමණක් නොව පකිස්ථානයේ සහ නොයෙක් ඉන්දියානු ඩයස් පෝරාවන් තුලද මෙම වෙනස් වීම් සිදු විය. මෙම කාලය තුල යුරෝපීය මධ්‍යම පාංතිකයනීගේද සංස්කෘතික බලපෑම හේතුවෙන්, ඉන්දීය මධ්‍යම පංතිකයන්ගේද පාරම්පරික අදහස් සහ පුරුදු යම් ආකාරයකට වෙනස් වන්නට විය (Meddegoda, 2015). ශාස්ත්‍රීය ගසල් රචනා තුල වූ ඉතා අතිශයෝක්තියෙන් යුත් අලංකාර සහ රූපක ආදියේ භාවිතය සහ ආදරය පෙරදැරි කරගත් බහු ස්ත්‍රී සේවනය හා

සම්බන්ධ අදහස් වලට යම් බලපෑමක් වීම හේතුවෙන්, මෙම කාලය තුල රචනා වූ ගසල් වල යම් වෙනසක් සිදුවී ඇති බව බොහෝ දෙනාගේ මතයයි. මෙම යුගයේ ගසල් රචකයන් අතර හාලි සහ මුහම්මද් ඉබ්බාල් ගෙන හැර දැක්විය හැකිය. ගසල් කාව්‍ය මූලධර්ම සහ ආකෘතිය උපයෝගී කර ගනිමින් ජාතිවාදය සහ ජාත්‍යාලය හා සම්බන්ධ අදහස් ප්‍රකාශ කිරීම එම අවධිය තුල සිදු වූ බව පැවසේ (Menon, 2013).

විසිවන සියවස තුල නව මාධ්‍ය ප්‍රවණතා පැමිණීමත් සමග ගසල් මහජනයා අතරට ව්‍යාප්ත වීම සීඝ්‍රයෙන් සිදු විය. වෛශ්‍යාවන් විසින් ගායනය කරන ලද ශාස්ත්‍රීය මට්ටමේ ගසල් ගායනයන් අනුකරණය කරමින් බේගම් අක්තර් (d.1974) නැමැති ගායිකාව විසින් මාධ්‍ය හරහා මහජනතාව අතරට ප්‍රචලිත කිරීමේ කාර්ය සිදු විය.

ආරම්භයේදී, සාරංගි, තබ්ලාව, ඩෝලය වැනි සංගීත භාණ්ඩ යොදා ගනිමින් ගසල් ගායනය සංවර්ධනය විය. පසුව හාර්මෝනියම් සහ අනෙකුත් සංගීත භාණ්ඩ ගසල් වාදන වෘන්දයට එකතු විය. ගසල් භාවිතය පාර්සි නාට්‍ය වලද යොදා ගැනුනු අතර පසුව හින්දි චිත්‍රපටවලට අවතීර්ණ විය. නොයෙකුත් සංස්කෘතිකාංග සඳහා දෙබස් ස්වරූපයෙන් සහ ගායන ස්වරූපයෙන් ගසල් කාව්‍ය යොදා ගැනිණ. අදාළ සංකෘතිකංගයේ සවභාවය අනුව ගසල් සඳහා යොදාගත් සංගීතයද විවිධාකාර වූ බව පැහැදිලිය.

අවධ නමැති රාජධානියේ විසූ නවාබ් වජිද් අලි ෂාහ් ගෙන් ගසල් කාව්‍ය සහ ඒ හා බැඳුනු සංගීතයට සිදු වූ සේවය ඉමහත්ය. ඔහුගේ මූල්‍ය අනුග්‍රහය සහ කලාකරුවෙකු වශයෙන් සහභාගීත්වය ඇතිව රඟදැක්වූ ''ඉන්ද්‍ර සභා'' නමැති ගීත නාටකය තුල ගසල් කාව්‍ය සහ සංගීතය ප්‍රධාන මුහුණුවරක් ගෙන ඇති බව සඳහන් වේ. ඉන්ද්‍ර සභා ගීත නාටකය අගා හසන් අමානත් නැමති කවියා විසින් උර්දු භාෂාවෙන් රචනා කර ඇත්තේ ගසල් කාව්‍ය ශෛලිය බහුල ලෙස භාවිතා කරමින්ය (Braginsky & Suvorova, 2008).

පසුව බොම්බායේ විසූ පර්සියානු අනුග්‍රාහකයන් විසින් එළි දැක්වූ පාර්සි නාට්‍යයන් තුළ ද ගසල් කාව්‍ය ශෛලිය ආශ්‍රිත රචනා උර්දු, හින්දි, ගුජරාති, සහ මරාටි වැනි භාෂාවන්ගෙන් නිර්මාණය වී ඇත. මෙම පාර්සි නාට්‍ය ලොව වටා සංචාරය කරමින් රඟ දක්වන ලදී. ඉන්දියානු නොවන් බොහෝ සංස්කෘතීන්ද මේ හරහා පෝෂණය වී ඇති බව ශ්‍රී ලංකාව සහ මැලේසියාව වැනි රටවල් වල සංස්කෘතික අංගවිමසා බැලීමෙන් පෙනී යයි. ගසල් කාව්‍ය සහ ඒ හා බැඳුණු සංගීතය විවිධ අයුරින් විදේශ රටවල ද ප්‍රචලිත වීමේ අවස්ථාවන් විශේෂයෙන් පාර්සි නාට්‍ය සහ හින්දි චිත්‍රපට හරහා සිදුවී ඇති බව සිතිය හැක (Hansen, 2001). හින්දි චිත්‍රපට තුලට ගසල් අනුගත කිරීමේදී ගසල් ගායකයන් සහ ඒ සඳහා වූ සහාය වාදන අංග ඉතා සරල ලෙස යොදා ගැනීමෙන් එහි මූලික ස්වරූපය යම් අයුරින් වෙනස් වීම නොවැලැක්විය හැක (Manuel, 1989).

යම් කිසි රිද්මයකට අනුව පැවසීම, සජ්ජායනය කිරීම, කව්වාලි වැනි ගායන විලාශයන් මඟින් ඉදිරිපත් කිරීම, සාරංගි හා තබ්ලාව වැනි සංගීත භාණ්ඩ යොදා ගනිමින් නර්තනයේද යෙදෙමින් ගායනා කිරීම, සහ නවීන වාද්‍ය වෘන්ද සහ සංගීත ක්‍රම භාවිත කරමින් ගායනා ඉදිරිපත් කිරීම වැනි බොහෝ ආකාරයන්ගෙන් ගසල් කාව්‍ය ඉදිරිපත් කෙරෙන බව පෙනී යයි.

ගසල් කාව්‍ය ශෛලිය සහ ඒ හා බැඳුණු සංගීතය පිළිබඳව ඉතිහාසයේ සිට අද දක්වා මෙවන් තොරතුරු විමසා බැලීමේදී පෙනී යන්නේ ගසල් යනු ප්‍රධාන වශයෙන් කාව්‍ය විශේෂයක් වන අතර මෙම කාව්‍ය නොයෙක් ආකාරයෙන් ඉදිරිපත් කිරීමේ සම්ප්‍රදායන් එහි ආරම්භයේ සිට අද දක්වා නොයෙක් මුහුණු වරින් විකාශනය වී ඇති බවය.

## References


Al-Amuli (Muhammad ibn Ahmad) (1335 - 1342). *Nafais al-funun*. British Museum manuscript. Add. 16827. fols.

Al-Farabi (n.y.; 870-950). *Kitab al-musiqi*. Madrid manuscript. Leyden manuscript.

Al-Muqbil, Badr b. (2007).`Alî. *Shi`r al-Ghazal fî Daw' Manhaj al-Adab al-Islamî* (Ghazal Poetry in Light of an Islamic Approach to Literature) Dammam: Dâr Ibn al-Jawzî.

Arberry, Peter John (1946). Orient Pearls at Random Strung. *Bulletin of SOAS*, 11, 699-712.

Avery, Peter (2007). *The Collected Lyrics of Hafiz of Shiraz* Translated from *Divān-e Hāfez*, Vol. 1, *The Lyrics (Ghazals)*. Edited by Parviz Natel-Khanlari from the manuscript Tehran, Iran, 1362 AH/1983-4. Cambridge: Archetype.

Bausani, Alessandro (1960). *Ghazal ii – in Persian Literature*. The Encyclopedia of Islam, New Edition 1, Leiden: E. J. Brill.

Bausani, Alessandro (1965). *Ghazal ii – in Persian Literature*. The Encyclopedia of Islam, New Edition 2:1033–1036. Leiden: E. J. Brill.

Braginsky, Vladimir, and Anna Suvorova (2008). *A new wave of Indian Inspiration: Translations from Urdu in Malay traditional literature and theatre.* Indonesian and the Malay World, 36 (104), 115–153.

Browne, Edward G. (2002). *A Literary History of Persia*. New Delhi: Goodword Books.

Elsner, Jürgen (2013). Personal Communication.

Farmer, Henry George (1928). *A History of Arabian Music to the 18th Century*. Glasgow: Glasgow University Press.

Hansen, Kathryn (2001). Parsi Theater, Urdu Drama, and the Communalization of Knowledge: A Bibliographic Essay. *The Annual of Urdu Studies*, vol. 16, 43–63.

Hasan, Laylâ Fu`âd Muhammad (1986). *Tatawwur Fann al-Ghazal fî al-Shi`r al-Safawî* (The Evolution of the Art of the Ghazal in Safavid Poetry) unpublished PhD dissertation. Cairo: `Ayn al-Shams University.

Ibn Ghaibi ('Abd al-Qadir) (n.y.). Jdmi'al-alhdn. Bodleian MS. Marsh 828.

Manuel, Peter (1979). *The Relationship between Prosodic and Musical Rhythms in Urdu Ghazal-Singing.* Edited by Muhammad Umar Memon. Studies in the Urdu Ghazal and Prose Fiction, 5. Madison: University of Wisconsin, 101–119.

Manuel, Peter (1989). *A Historical Survey of the Urdu Ghazal-Song in India*. Asian Music, 20 (1): 93–113.

Meddegoda, Chinthaka P. (2015). Musical Traces of Hindustani Culture in Malay Ghazal. PhD Diss. Putra University, Malaysia.

Meisami, Julie Scott (1998). *Ghazal*. Edited by Meisami, Julie Scott and Starkey, P. Encyclopedia of Arabic Literature, 1, 249.

Menon, Jisha (2013). The Performance of Nationalism: India, Pakistan, and the Memory of Partition. Cambridge: Cambridge University Press.

Qureshi, Regula Burckhardt (1990). *Musical Gesture and Extra-Musical Meaning: Words and Music in the Urdu Ghazal*. Journal of the American Musicological Society, 43 (3), 457–497.

Sayyid Naqī Ḥusain Ja‘farī (2010). *Essays on Literature, History & Society: Selected Works of Professor Syed Naqi Husain Jafri.* New Delhi: Primus.